# දෙවන ලෝක යුද්ධයෙන් පසු ව ලෝක බල තුලනය


5

## ඇමරිකා එක්සත් ජනපදය ලෝක බලවතකු ලෙස නැඟී ඒම

### ඇමරිකා එක්සත් ජනපදය (ඇ.එ.ජ) නැඟී සිටි ආකාරය

ක්‍රි.ව. 1776 ජූලි මස 4 වැනි දින ඇමරිකා එක්සත් ජනපදය නිදහස් රාජ්‍යයක් බවට පත් විය. එතැන් පටන් 20 වන සියවසේ මුල් භාගය දක්වා එරට ජාත්‍යන්තර කරලියට පැමිණීමට පෙර ශක්තිමත් දේශීය ප්‍රතිපත්තියක් සකස් කිරීමේ නිරත ව සිටි බව ඉතිහාසයෙන් පැහැදිලි වේ.

ඇමරිකා එක්සත් ජනපදය ලෝක බලවතකු ලෙස නැඟී සිටීමේ දී ඔවුන් අනුගමනය කළ දේශීය ප්‍රතිපත්තිය ද විදේශීය ප්‍රතිපත්තිය තරම් ම වැදගත් විය. මේ නිසා එම දේශීය කටයුතු පිළිබඳ ව ද මෙහි දී අපි කෙටියෙන් අවධානය යොමු කරමු.




සිතියම 5.1 ඇමරිකා එක්සත් ජනපදය

ඇමෙරිකා එක්සත් ජනපදය ලෝක බලවතකු ලෙස නැඟී සිටියේ 1914-1919 දක්වා පැවතුණ පළමුවන ලෝක මහා යුද්ධයෙන් පසු ව ය. එතෙක් මුළු 19 වන සියවස තිස්සේ ම දක්නට ලැබෙන්නේ මතු යම් දිනක ලෝක බලවතකු ලෙස නැඟී සිටීමේ අධිෂ්ඨානයෙන් හා ජාතිකාභිමානයෙන් යුතු ව, ඇමෙරිකා එක්සත් ජනපදයේ පාලකයන් මෙන් ම ජනතාව ද තම රට අභ්‍යන්තර වශයෙන් ශක්තිමත් ව ගොඩ නඟා ගැනීමට ඇප කැප වීම යි.

බ්‍රිතාන්‍ය ආධිපත්‍යයෙන් නිදහස ලබා ගත් යටත් විජිත දහතුන, එක් රාජ්‍යයක් ලෙස නැඟී සිටීමට සුදුසු ආණ්ඩු ක්‍රමයක් සම්පාදනය කොට ගැනීම, ඇමරිකා එක්සත් ජනපදය අනුගමනය කළ මුල් ම ක්‍රියා මාර්ගය විය. එවකට සෙසු යුරෝපා රටවල තිබූ, අසහාය ආණ්ඩු ක්‍රමය හෝ ඇමෙරිකා එක්සත් ජනපදය ගොඩ නැගූ ජනපද 13න් වැසියන්ගේ මුල් භූමිය වූ එංගලන්තයේ ඉතිහාසය පුරා ම වාගේ ක්‍රියාත්මක වූ පාර්ලිමේන්තු ක්‍රමය හෝ පිළිනොගෙන, විධායක ජනාධිපති ධූරයකින් සමන්විත සන්ධීය ආණ්ඩු ක්‍රමයක් ගොඩ නඟා ගනු ලැබී ය. එමඟින් එකිනෙකට වෙනස් ව වෙන් ව පැවති රාජ්‍යයන් 13ක් බඳු යටත් විජිත 13 එක්සත් රාජ්‍යයක් ලෙස සංවිධානය වීමට අවශ්‍ය ආණ්ඩු ක්‍රමයක් ගොඩ නඟා ගෙන ඇත.

අනතුරු ව ඇමරිකා එක්සත් ජනපදය නමැති රට තම රාජ්‍යය ශක්තිමත් ව ගොඩ නඟා ගැනීමට අවශ්‍ය ආර්ථික ප්‍රතිපත්තිය ද, තෝරා ගනු ලැබී ය. පුද්ගලික ව්‍යවසාය මත පදනම් වූ ධනවාදී ආර්ථික ක්‍රමය, ඒ සඳහා උචිත ප්‍රතිපත්තිය ලෙස තෝරා ගන්නා ලදී. ඒ පළමු ජනාධිපති වූ වොෂින්ටන්ගේ රාජ්‍ය ලේකම්වරයකු වූ ඇලෙක්සැන්ඩර් හැමිල්ටන් විසිනි. අනතුරු ව බලයට පත් වූ සියලු ම ජනාධිපතිවරුන් යටතේ එම ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යනු ලැබී ය. ක්‍රි . ව. 1776 නිදහස ලබන අවස්ථාවේ එරට පැවතියේ තැනින් තැන විසිර පැවති කුඩා ඉඩම් හිමියන්ගෙන් යුක්ත කෘෂිකාර්මික සමාජයකි. 19 වන සියවස අවසානය වන විට ඇමෙරිකා එක්සත් ජනපදය ඉතා පුළුල් කාර්මික විප්ලවයකට මුහුණ දෙමින්, මහා පරිමාණ කර්මාන්ත මත පදනම් වූ ධනවාදී ආර්ථික ක්‍රමයක් ගොඩ නගාගෙන තිබිණි. ඒ සඳහා අවශ්‍ය ඉඩම්, වාරිමාර්ග සහ ඛනිජ සම්පත් ඇමෙරිකා එක්සත් ජනපදය සතු ව තිබිණි. කර්මාන්ත දියුණුවත් සමග ම දුම්රිය මාර්ග පද්ධතිය හා විදුලිබල නිෂ්පාදනය වැනි සෙසු යටිතල පහසුකම් ද වර්ධනය කර ගැනිණි. ඒ අතර විශාල ඉඩම් යායවල් හිමි ගොවි පංතිය සහ කම්කරු පංතිය ද ශීඝ්‍රයෙන් දියුණු විය. ඇමෙරිකා එක්සත් ජනපදය විසින් ධනවාදී ආර්ථික ක්‍රමය ඔස්සේ වසර 125ක් වැනි කාලය තුළ ලෝක බලවතකු වීමට අවශ්‍ය ආර්ථික ශක්තිය 1900 පමණ වන විට ගොඩ නඟා ගෙන තිබිණි.

ඇමෙරිකා එක්සත් ජනපදය එපරිද්දෙන් නැඟී සිටීමට සුදුසු ආකාරයේ විදේශ ප්‍රතිපත්තියක් ද, 19 වන සියවස පුරා ක්‍රියාත්මක කරන ලදී. එකල සෙසු ලෝකය පුරා ම දක්නට ලැබුණේ, යුරෝපය කේන්ද්‍ර කොට ගෙන ආසියා, අප්‍රිකා, ලතින් ඇමරිකා මහාද්වීපවල යටත්විජිත සහිත අධිරාජ්‍ය ගොඩ නඟා ගැනීම සහ ඒවා සම්බන්ධ ව යුරෝපා රාජ්‍යය අතර අරගල ඇති කොට ගැනීම යි. ඇමෙරිකා එක්සත් ජනපදය ශක්තිමත් අඩිතාලමක ගොඩ නැගෙන තෙක්, එබඳු බාහිර අරගලවලට මැදිහත් වීම නුසුදුසු බව තීරණය කළ පළමුවන ජනාධිපති ජෝර්ජ් වොෂින්ටන්, ඇමෙරිකා එක්සත්

ජනපදය විදේශීය කටයුතුවල දී හුදකලාව සිටීමේ ප්‍රතිපත්තියක් ප්‍රකාශයට පත් කෙළේ ය. අනතුරු ව බලයට පත් වූ ජනාධිපතිවරුන් විසින් ද එම ප්‍රතිපත්තිය අනුගමනය කරන ලදී. 1820 දී ජනාධිපති මොන්රෝ විසින් සුප්‍රසිද්ධ ''මොන්රෝ ප්‍රකාශනය''මඟින් එම ප්‍රතිපත්තිය තහවුරු කරනු ලැබී ය.

ඒ අතර 1865 දී ඇමෙරිකා එක්සත් ජනපදයේ එක්සත්කම සිඳී යන ආකාරයේ අභ්‍යන්තර සිවිල් යුද්ධයක් ද ඇති විය. එසේ වුව ද එතෙක් ගොඩ නඟා ගෙන තිබූ ශක්තිය අනුව එම බාධකය ද ජයගෙන එමඟින් ජාතික එක්සත්කම වඩාත් තහවුරු කොට ගැනීමට පියවර ගැනිණි. කර්මාන්ත, කෘෂිකර්මය, වෙළෙඳාම යන සියලු ක්ෂේත්‍රවල ශීඝ්‍ර දියුණුවක් ඇති වූ ඇමෙරිකා එක්සත් ජනපදය 19 වන සියවස අවසාන භාගය වන විට, අභ්‍යන්තර වශයෙන් ලෝකයේ ධනවත් ම රාජ්‍යයන් අතර ඉහළ ස්ථානයකට පත් ව තිබිණි. ඒ නිසා එම රටට ද බාහිර ලෝකය ගැන උනන්දුවක් දැක්වීමට සහ බාහිර ලෝකයට ව්‍යාප්ත වීමේ අවශ්‍යතාව ද මතු වී තිබිණි.

ආර්ථික ලාභ අපේක්ෂාව සහ ජාතික කීර්තිය සඳහා එබඳු ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ යුතු වුව ද, එකල සෙසු යුරෝපා ජාතීන් කළ ආකාරයට ම යටත් විජිත අධිරාජ්‍යය ගොඩ නැඟිය හැකි ප්‍රදේශ කිසිවක් ඔවුන්ට ඉතිරි ව තිබුණේ නැත. ඒ නිසා ඇමෙරිකා එක්සත් ජනපදය, අලුත් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම කෙරෙහි අවධානය යොමු කෙළේ ය. එකල ඉතා පුළුල් වෙළෙඳ අවස්ථා පැවති චීනයේ හා ජපානයේ ඇතැම් වරායන් යුරෝපා ජාතීන්ගේ ග්‍රහණයට හසුකර ගෙන තිබිණි. ඇමරිකා එක්සත් ජනපදයේ අදහස වූයේ "චීනයේ හා ජපානයේ වෙළෙඳ කටයුතුවලට සම්බන්ධ වීමට ලෝකයේ සෙසු සියලු ම ජාතීන්ට අවස්ථාව ලබා දිය යුතු" බව ය. "විවෘත ද්වාර ප්‍රතිපත්තිය" නමින් සඳහන් වූ එම නව යෝජනාව 1899 දී රාජ්‍ය ලේකම් ජෝන් ලෝ විසින් ඉදිරිපත් කරන ලදී. එමඟින් මුල් වරට ඇමෙරිකා එක්සත් ජනපදය, පුළුල් ලෙස විදේශීය වෙළෙඳ කටයුතු පිළිබඳ ව, යුරෝපා ජාතීන් හා සමාන තත්ත්වයක් ලබා ගැනීමට ඉදිරිපත් වූයේ, 1896-1906 කාලය තුළ ජනාධිපති ධුරය දැරූ මැකෙන්ලිගේ පාලන සමයේ දී ය. එහෙත් කිසියම් බලයක් විදහාලමින් මුල් වරට ඇමෙරිකා එක්සත් ජනපදය ගැටීමක් ඇති කර ගන්නේ 1898 දී ස්පාඤ්ඤය සමඟ ය.

## ඇමෙරිකා එක්සත් ජනපදය හා ස්පාඤ්ඤය අතර ගැටීම

ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ පුළුල් ලෙස වෙළෙඳ සබඳතා පැවති කියුබාව ක්‍රි. ව. 1890 වන විට පැවතියේ ස්පාඤ්ඤය යටත් විජිතයක් වශයෙනි. 1895 දී තම මව් රාජ්‍යයේ දැඩි ඒකාධිපති පාලනයට විරුද්ධ ව කියුබාව නිදහස් සටනක් ආරම්භ කෙළේ ය. මුල දී ඇමෙරිකා එක්සත් ජනපදය මධ්‍යස්ථ ව සිටි නමුත් 1898 දී, හවානා වරායේ නවතා තිබූ ඇමෙරිකා එක්සත් ජනපදයට අයත් නෞකාවකට පහර දීමත් එමඟින් 260 දෙනෙකු මරණයට පත් වීමත් සමඟ ඇමෙරිකා එක්සත් ජනපදය ස්පාඤ්ඤයට එරෙහි යුද්ධයට මැදිහත් විය. එම යුද්ධ අවස්ථාවේ නිදහස ප්‍රදානය කිරීමට පෙර, තාවකාලික ව, සීමිත කාලසීමාවකට කියුබාව ඇමෙරිකා එක්සත් ජනපදය යටතට පත් කෙරිණි. එහෙත් ඊට වඩා ඇමෙරිකා එක්සත් ජනපදය ලත් ජයග්‍රහණය වූයේ, ස්පාඤ්ඤයට

අයත්ව තිබූ පෝටෝරිකෝ, ගුවාම් සහ පිලිපීනය යන ප්‍රදේශ තම රටට පවරා ගැනීම යි. නව වෙළෙඳ කටයුතු පුළුල් කර ගැනීම සඳහා චීනය හා ජපානය දෙසට යොමු වීමට බලාපොරොත්තුවෙන් සිටි ඇමෙරිකා එක්සත් ජනපදයට, එම ප්‍රදේශ විශේෂයෙන් පිලිපීනය අයිති වීම අතිශය වැදගත් විය.

ඇමෙරිකා එක්සත් ජනපදයට අධිරාජ්‍යවාදී ව්‍යාප්ති කටයුතුවලට අවතීර්ණ වීමට මග හෙළි කළ මෙම ජයග්‍රහණයෙන් පසුව ද වැඩි කලබලයකින් තොර ව, එරට අභ්‍යන්තර කටයුතු වැඩි දියුණු කිරීමේ සහ චීනය සමඟ වෙළෙඳ කටයුතු පුළුල් කර ගැනීමේ ගනුදෙනුවල නිරතවනු දක්නට ලැබිණි.

ඇමෙරිකා එක්සත් ජනපදය ලෝක බලවතකු වශයෙන් රාජ්‍යයන් සමඟ එකතු වී, සෘජු ව ගැටුම්කාරී තත්ත්වයකට මැදිහත් වූයේ, පළමුවන ලෝක යුද්ධය ආරම්භයත් සමඟ ය.

## පළමුවන ලෝක යුද්ධයට සම්බන්ධවීම

දීර්ඝ කාලයක් තිස්සේ ඇමෙරිකා එක්සත් ජනපදය අනුගමනය කළ මැදිහත් නොවීමේ ප්‍රතිපත්තිය අත් හැර 1914 දී යුරෝපා ජාතීන් අතර ආරම්භ වූ යුද්ධයට සම්බන්ධ වීමට තීරණය කෙළේ ය. 1915 දී එ රට වැසියන් ද ගමන් ගත් "ලුසිටානියා" නම් බ්‍රිතාන්‍ය මගී නෞකාව ජර්මානුවන් විසින් ගිල්වා දැමීම එම තීරණයට තුඩුදුන් ආසන්නතම හේතු විය.

ඔබ මෙම මාතෘකාව පිළිබඳ පුළුල් ලෙස ඉහත 4 වන පරිච්ඡේදයේ දී ඉගෙන ගත්තා මතක ඇතැ යි සිතමු. එහි දී එක්සත් ජනපදය, ප්‍රංශය, බ්‍රිතාන්‍යය, බෙල්ජියම, කැනඩාව, ඕස්ට්‍රේලියාව, ජපානය, බ්‍රසීලය, චීනය, ඉතාලිය, පෘතුගාලය වැනි රටවල් අයත් වූ මිත්‍ර පක්ෂයට එකතු වී මධ්‍යම බලවතුන් වූ ජර්මනිය, ඔස්ට්‍රියාව, හංගේරියාව, තුර්කිය හා බල්ගේරියාව ප්‍රමුඛ රටවලට එරෙහි ව යුද්ධ ප්‍රකාශ කළෝ ය.

ජනාධිපති වුඩ්රෝ විල්සන් කරුණු 14කින් යුත් "සර්ව සාධාරණ හැඟීම්" යන ලියවිල්ල මධ්‍යම බලවතුන් වෙත ඉදිරිපත් කළේ ය. එයින් බලාපොරොත්තු වූයේ පරාජිත පක්ෂයට ද ගෞරවයක් ලැබෙන පරිදි කටයුතු කිරීම යි.

**සර්ව සාධාරණත්වයේ හැඟීම් කිහිපයක් නම්**

1. සාධාරණ නිදහසක් ඇති කිරීම,
2. ජාත්‍යන්තර ඔත්තු සේවා අහෝසි කිරීම,
3. සාගර භාවිතයේ දී නිදහස ඇති කිරීම,
4. යුද අවි නිෂ්පාදනය අඩු කිරීම,
5. ආර්ථික සම්බාධක නො පැනවීම යනාදිය යි.

1920 දශකය වන විට, පළමුවන ලෝක මහා සංග්‍රාමය නිම වීමත් සමඟ ලෝක ආර්ථික අර්බුදයක් හට ගත් බැවින්, බොහෝ රටවල ආර්ථික තත්ත්වයන් අඩාල විය. එහෙත් ඇමෙරිකා එක්සත් ජනපදයේ ආර්ථිකය මේ වන විට ඉතා ශක්තිමත් තත්ත්වයක පැවතිණි. එයට ප්‍රධාන හේතුව වූයේ, ලොව සෙසු රටවල් ආයුධ මිල දී ගැනීම සඳහා ඇමරිකාවට විශාල වශයෙන් මුදල් ගෙවා තිබීම ය. එමෙන් ම ඇමෙරිකා එක්සත් ජනපදය ලොව පුරා රටවලට ඒවා අලෙවි කරනු ලැබී ය. එවකට එරට ප්‍රධාන ආදායම් මාර්ගය වූයේ අවි ආයුධ වෙළෙඳාම ය. අවි ආයුධ නිපදවීම හා අලෙවි කිරීම වර්තමානයේ ද, එරට ප්‍රධාන ආදායම් මාර්ගය වේ.



රූපය 5.1 ඇ.එ.ජ.ජනාධිපති නිල නිවස (ධවල මන්දිරය)

## දෙවන ලෝක යුද්ධයට සම්බන්ධ වීම

දෙවන ලෝක යුද්ධය අතරතුර 1941 දෙසැම්බර් 07 වැනි දින ජපානය ඇමෙරිකා එක්සත් ජනපදයේ පර්ල් වරායේ නතර කර තිබූ යුද නැව්වලට, ගුවන් ප්‍රහාර එල්ල කළේය. ඒ සමඟ ම එක්සත් ජනපදය, දෙවන ලෝක මහා සංග්‍රාමයට එක් විය. ඒ වන විට ජනාධිපතිධූරය දැරුවේ ප්‍රැන්ක්ලින් ඩෙලනෝ රූස්වෙල්ට් ය.

### දෙවන ලෝක යුද්ධයට එක්සත් ජනපදය

- ගුවන් යානා හැටදහසක්
- ගුවන් යානා නාශක අවි විසි දහසක්
- යුද ටැංකි හතළිස් පන්දහසක්
- යුද නැව් 1275ක් යොදවා ඇත.

1945 පෙබරවාරි වන විට ඇමෙරිකා එක්සත් ජනපද හමුදාව, ජපානය වටලා යටත් වන ලෙස දැන්වී ය. එයට එකඟ නොවූ නිසා, ජපානයට පරමාණු බෝම්බ හෙළන ලදී. එයින් පසු සැප්තැම්බර් මස 2 වැනි දින ජපානය යටත් විය. ඒ වන විට න්‍යෂ්ටික අවි සතු එක ම බලවත් රාජ්‍යය වූයේ, එක්සත් ජනපදය යි. දෙවන ලෝක යුද්ධයේ දී න්‍යෂ්ටික අවි භාවිත කිරීම නිසා ඇමෙරිකා එක්සත් ජනපදය ලෝක බලවතකු ලෙස නැඟී ආවේ ය. ඒ සමඟ ම එක්සත් ජනපදය ලෝක කටයුතුවල දී ප්‍රමුඛ ස්ථානයනට පත් ව ඇති බව දක්නට ලැබිණි.



රූපය 5.1 එක්සත් ජනපදයේ නිෂ්පාදිත ගුවන් යානයක්

## ඇමරිකා එක්සත් ජනපදය ධනවාදී කඳවුරේ නායකත්වයට පත් වීම

දෙවන ලෝක මහා සංග්‍රාමය අවසන් වීමත් සමඟ ලොව විවිධ ජාතීන් බලාපොරොත්තු වූයේ, බ්‍රිතාන්‍යය ,එක්සත් ජනපදය හා රුසියාව එක් ව 'ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා තිරසාර වැඩ පිළිවෙළක් ගොඩ නඟනු ඇත' යන්න ය. 1917 රුසියානු විප්ලවයෙන් පසු ව රුසියාව ලෝකයේ කොමියුනිස්ට් පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීමට මූලික වී ක්‍රියා කළ අතර, ලෝකයේ ධනවාදී කඳවුරේ නායකත්වය ගෙන කටයුතු කෙළේ ඇමෙරිකා එක්සත් ජනපදය යි.

> ප්‍රජාතන්ත්‍රවාදයේ මහා නියමුවන් අප විය යුතු ය.
> ප්‍රැන්ක්ලින් ඩී රූස්වෙල්ට්
> (1946.01.06- කොන්ග්‍රසය අමතා කළ කථාව)

ප්‍රජාතන්ත්‍රවාදය නගා සිටුවීම සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය විසින් දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසු ජාත්‍යන්තර වශයෙන් වැදගත් කටයුතු රැසක් සිදු කරනු ලැබී ය. ඒ වන විට ආසියා හා අප්‍රිකා රටවල් බොහොමයක් යුරෝපයේ බ්‍රිතාන්‍යය, ප්‍රංශය ප්‍රමුඛ රටවල යටත් විජිත වශයෙන් පැවතිණි. ඒවාට නිදහස ලබා දීම සම්බන්ධ ව එක්සත් ජනපදය ඉල්ලීම් කෙළේ ය.

එසේ ම ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපති හැරි. එස්. ටෲමන් මහතා පිලිපීනයට නිදහස ලබා දීමට පියවර ගත්තේ ය. එසේ ම බ්‍රිතාන්‍යය යටතේ වූ ඉන්දියාව, පාකිස්තානය, බුරුමය(මියන්මාර්) යන රටවලට නිදහස ලබා දෙන ලෙස ද, එක්සත් ජනපදය ඉල්ලා සිටියේ ය. ඕලන්දය යටතේ වූ ඉන්දුනීසියාවට නිදහස ලබා දීමේ දී එක්සත් ජනපදය, අතරමැදියකු ලෙස කටයුතු කොට ඇත.

එමෙන් ම අප්‍රිකාවේ ඝානා, නයිජීරියා, කෙන්යා ඇතුළු බොහෝ රටවලට නිදහස ප්‍රදානය කිරීමට එක්සත් ජනපදයේ ක්‍රියා කලාපය ද හේතු විය.

ප්‍රධාන වශයෙන් ඇමෙරිකා එක්සත් ජනපදයට අවශ්‍ය වූයේ, උපක්‍රමශීලී ව යුරෝපයේ සෙසු බලවතුන්ගේ බලය බිඳ දමා තමාට ම ලෝක දේශපාලනය තුළ ප්‍රමුඛස්ථානය ලබා ගැනීමට ය. ඇමෙරිකා එක්සත් ජනපදයට පක්ෂ මෙන් ම විපක්ෂ රටවලට එදා තිබු වැදගත් ම බලය වූයේ, ඒ රටවලට අයිති ව තිබූ විශාල අධිරාජ්‍යයන් ය. ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් ඒවා බිඳ දමා යටත් විජිතවලට නිදහස ලබා දීමෙන්, එක්සත් ජනපදය බලාපොරොත්තු වූයේ, වක්‍රාකාරයෙන් තම ධනවාදී ක්‍රමය එම ප්‍රදේශවල ව්‍යාප්ත කොට, ඒවා තම බළ කඳවුරට එක් කොට ගැනීම ය.

නිදහස ලැබූ ආසියා අප්‍රිකා රටවල් ධනවාදී ආර්ථිකය හා ප්‍රජාතන්ත්‍රවාදී පාලනය අනුව කටයුතු කරනු ඇතැයි, එක්සත් ජනපදය බලාපොරොත්තු විය. ඒ වන විට එරට ප්‍රතිවාදියා ලෙස මතු වී සිටියේ, සමාජවාදී සෝවියට් රුසියාව යි. එම නිසා අලුතෙන් නිදහස ලබන රටවල් තුළ සමාජවාදය ව්‍යාප්ත වීම වැළැක්වීමට ද එක්සත් ජනපදයට අවශ්‍ය විය. උදාහරණ වශයෙන් බෙල්ජියානු කොංගෝවේ කටංගා ප්‍රදේශයේ ඛනිජ වර්ග එනම් යුරේනියම්, තඹ හා දියමන්ති බහුල ව තිබිණි. එක්සත් ජනපදයේ සහාය ඇති ව යුරෝපීය ධනවාදී වෙළෙඳ සංගම්වල මෙහෙය වීම මත මොයිස් ෂොම්බේ, කටංගා ප්‍රදේශය නිදහස් රාජ්‍යයක් ලෙස ප්‍රකාශයට පත් කළේ ය. එහි දී ඇති වූ සටන්වලින් කොංගෝවේ පාලකයා වූ ද සමාජවාදී පිලට හිතවත් වූ ද පැට්‍රිස් ලුමුම්බා මියගිය අතර ෂොම්බේ ජය ගෙන ධනවාදී කඳවුරට නැඹුරු විය.

## මාර්ෂල් සැලැස්ම

1948 දී ක්‍රියාත්මක කළ මේ සැලැස්ම තුළින් ද ඇමෙරිකා එක්සත් ජනපදය උත්සාහ ගෙන ඇත්තේ, ලෝකයේ අලුත නිදහස ලැබූ රටවල් ධනවාදයට හා ප්‍රජාතන්ත්‍රවාදයට නැඹුරු කොට ගැනීමට ය. එරට කියා සිටියේ අධිරාජ්‍යවාදයෙන් මිදී සංවර්ධනය වෙමින් පවතින රටවලට ආධාර දීම සඳහා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන බව යි. ඒ අනුව ආසියා, අප්‍රිකා හා ලතින් ඇමරිකානු රටවලට කෘෂිකාර්මික අධ්‍යාපන, සෞඛ්‍ය යනාදී විවිධ ක්ෂේත්‍රවලට විශේෂඥ ආධාර ලබා දුනි. නෝර්වේ, බෙල්ජියම, බටහිර ජර්මනිය, නෙදර්ලන්තය, ලක්සම්බර්ග්, ග්‍රීසිය, තුර්කිය, පෘතුගාලය වැනි රටවල් ඒ යටතේ ආධාර ලබා ගෙන ඇත. සෝවියට් රුසියාව ප්‍රමුඛ නැගෙනහිර යුරෝපා රටවල් මේ ආධාර ප්‍රතික්ෂේප කළහ.

## නේටෝ (NATO) සංවිධානය පිහිටුවීම

ඇමෙරිකා එක්සත් ජනපදයේ මූලිකත්වයෙන් යුත් ධනවාදී පක්ෂයට 1948 දී බටහිර ජර්මනිය ද එකතු විය. ඒ නිසා බටහිර ජර්මනියට අවශ්‍ය ආහාර, ඖෂධ වැනි දෑ රැගෙන යන දුම්රිය මාර්ග රුසියාව වසරක කාලයකට වසා දැමී ය. රුසියාවේ මෙවැනි තර්ජනවලින් බේරීමට ධනවාදී කඳවුරට හිතවත් රටවල් එක්වී, 1949 අප්‍රේල් මාසයේ දී අත්සන් කළ ''වොෂිංටන් ගිවිසුම'' මඟින් උතුරු අත්ලන්තික් ගිවිසුම් සංවිධානය (NATO) පිහිටුවා ගැනිණි. එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ඉතාලිය, කැනඩාව, ඩෙන්මාර්කය, බෙල්ජියම, ඕලන්දය, ලක්සම්බර්ග්, නෝර්වේ, පෘතුගාලය, අයිස්ලන්තය, තුර්කිය, බටහිර ජර්මනිය, ස්පාඤ්ඤය, ග්‍රීසිය යන රටවල් 16ක් එහි සාමාජිකයෝ වූහ. 1974 දී ග්‍රීසිය ඉන් ඉවත් විය. මෙහි මූලස්ථානය බෙල්ජියමේ බ්‍රසල්ස් නුවර පිහිටා ඇත. නේටෝ සංවිධානය පිහිටුවීමේ අරමුණ වොෂින්ටන් ගිවිසුමේ පස්වන ඡේදයෙන් පැහැදිලි ය.

> "සාමාජික වූ යුරෝපයේ හෝ උතුරු ඇමරිකාවේ හෝ කිසිදු රාජ්‍යයකට එල්ල වන සතුරු ප්‍රහාරයක් සාමාජික රටවල් සියල්ලට ම එරෙහි වූවක් සේ සලකන්නට ගිවිස ගනිමු."
>
> නේටෝ සම්මුතිය - 5 වන ඡේදය

එක්සත් ජනපදය ප්‍රමුඛ ධනවාදී කඳවුරේ බලය ආරක්ෂා කොට ගැනීම, නේටෝ සංවිධානයේ ප්‍රධාන අරමුණ විය. ඒ සඳහා එම රටවල වාර්ෂික අයවැයෙන් 20%කට වඩා වැඩි මුදලක් ආරක්ෂක කටයුතුවලට යොදා ගෙන ඇත. එක්සත් ජනපදය ධනවාදී ආර්ථිකයත් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයත් ව්‍යාප්ත කිරීමට නේටෝ සංවිධානය යොදා ගෙන ඇත.

## ඇමරිකානු රාජ්‍ය සංවිධානය

ලතින් ඇමෙරිකානු රටවල් 21ක් සමඟ එක් ව එක්සත් ජනපදය විසින් ඇමරිකානු රාජ්‍ය සංවිධානය ආරම්භ කරන ලදී. එහි අරමුණ වූයේ කියුබාව හරහා, සමාජවාදය එම රටවලට ඇතුළුවීමට තිබූ ඉඩ ප්‍රස්තාවන් අහිමි කිරීම ය. කොස්ටරිකාව, හොන්ඩියුරාස්, ගෝතමාලා, නිකරගුවාව, ආර්ජන්ටිනාව, බ්‍රසීලය, කොලොම්බියා, එල්සැල්වදෝරය, මැක්සිකෝව, පැනමාව, පේරු, උරගුවේ, වෙනිසියුලාව ආදි රාජ්‍යයන් ඊට අයත් වේ. වර්තමානය වන විට ලතින් ඇමරිකානු රටවලට ආවේණික විරැකියාව, උද්ධමනය, දිළිඳුකම වැනි ප්‍රශ්න විසඳා ගැනීමට සාමාජික රටවල් උත්සාහ ගැනීම නිසා, එක්සත් ජනපදයේ මඟ පෙන්වීම නොසලකා හරින මට්ටමට පත් ව ඇත. එයට හොඳ ම උදාහරණය වෙනිසියුලා ජනාධිපති හියුගෝ චාවේස් එක්සත් ජනපදයට නිතර අභියෝග කරමින් සිටීම දැක්විය හැකි ය.

## ඊශ්‍රායලය බිහි කිරීම

1948 බැල්පර් ප්‍රකාශනය මඟින් ඊශ්‍රායලය බිහි කරනු ලැබූ අතර, එය ක්‍රි.ව. පළමු වැනි සියවසේ සිට ලොව පුරා විසිරී සිටි යුදෙව් ජාතිකයන් ඒකරාශී කළ රාජ්‍යයකි. ඊශ්‍රායලය පිහිටුවීම බහුතර අරාබි ජාතිකයන්ගේ විරුද්ධතාව මැද සිදු වූවකි. එක්සත් ජනපදයේ බලය, මැද පෙරදිග ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන ආධාරකරුවා වන්නේ ඊශ්‍රායලය යි. එහෙයින් වර්තමානයේ පවා ඇමෙරිකා එක්සත් ජනපදය සහ ඊශ්‍රායලය අතර වඩාත් මිත්‍රශීලී සම්බන්ධතා පවතී.

### රහස් ඔත්තු සේවා

මධ්‍යම රහස් ඔත්තු කාර්යාංශය (CIA) ඇමරිකාව සතු ය. එහි සේවය කරන පිරිස 20000කට අධික ය. ලොව පුරා විසිරී ඇති පුවත්පත් කලාවේදීන්, නීතිඥයන්, අමාත්‍යවරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, මහාචාර්යවරුන් ඇතුළු විවිධ පුද්ගලයන් තම කටයුතුවලට යොදා ගැනීමට මෙම සේවාවට හැකි වී ඇත. යුදමය වශයෙන් හෝ බුද්ධිමය වශයෙන් ක්‍රියාත්මක වී එක්සත් ජනපදයේ ප්‍රතිපත්තිවලට එරෙහි ව මතු වන බලවේග මර්දනය කිරීම එම ඔත්තු සේවයේ අරමුණ ය. සෝවියට් දේශය බිඳ වැටීම ද එම සංවිධානයේ ක්‍රියාකාරිත්වය මත සිදු වූවක් බව දැන් හඳුනාගෙන ඇත.

ඊශ්‍රායලය ද ලොව ප්‍රබල ඔත්තු සේවාවක් පවත්වා ගෙන යයි. ඒ මොසාඩ් සංවිධානය යි. ඔවුන්ගේ කාර්යය ද සමාජවාදයට එරෙහි ඇමෙරිකන් චින්තනය ව්‍යාප්ත කිරීම යි.

## සමාජවාදයට එරෙහි රටවලට දෙන සහාය

උතුරු කොරියාව සමාජවාදී කඳවුරට බැඳෙන විට දකුණු කොරියාවට එක්සත් ජනපද හමුදා හා ආර්ථික ආධාර ලැබිණි. චීනය අග්නිදිග ආසියාවේ ප්‍රබල සමාජවාදී රාජ්‍යය බවට පත් වන විට, අසල්වැසි සෙසු රටවල් තුළ එම ක්‍රමය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා එක්සත් ජනපදයේ ආධාර ලැබූ කැරලි කණ්ඩායම් යොදා ගැනීමට ද ප්‍රබල උත්සාහයක යෙදිණි.

මේ අයුරින් විවිධ ක්‍රම අනුගමනය කරමින් එක්සත් ජනපදය විසින් ධනවාදී ආර්ථික ක්‍රමයත් ප්‍රජාතන්ත්‍රවාදී පාලනයත් ස්ථාපිත කිරීමට ප්‍රබල උත්සාහයක් දරනු ලැබේ.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම**


ඇමෙරිකා එක්සත් ජනපදය ලෝකයේ ධනවාදී පිල ගොඩ නඟා ගත් ආකාරය පැහැදිලි කරන්න.

## සෝවියට් රුසියාව ලෝක බලවතකු ලෙස නැඟී සිටීම

සාමය, ඉඩම් හා පාන් ලබා දෙන බවට පොරොන්දු වී ලෙනින් ගොවියන්ගේ හා කම්කරුවන්ගේ සහාය ඇති ව 1917 ඔක්තෝබර් විප්ලවය ජයගෙන සමාජවාදී සෝවියට් රුසියාව බිහි කෙළේ ය. සමාජවාදී විප්ලවය සාර්ථක වීමට බලපෑ හේතු කිහිපයකි.

- ඒකාධිපති සාර් පාලනය නිසා ජනතාවට එල්ල වූ පීඩනය
- රුසියාවේ පැවති ආර්ථික පීඩනය
- ගොවියන් කම්කරුවන් සොල්දාදුවන් මුහුණ පා සිටි ප්‍රශ්න
- වංශාධිපතිවරුන්ගේ පීඩාකාරී බලය
- පූජකයන් සහ රදලයන් අධික ලෙස සැප විඳීම වැනි කරුණු ඒ අතර ප්‍රධාන වේ.

රුසියානු විප්ලවය මගින් ඉඩම්, බැංකු, පුද්ගලික ව්‍යාපාර යනාදිය ජන සතු විය. කර්මාන්ත ශාලා පාලනය කම්කරු කමිටුවලට ලබා දුනි. මේ නිසා 1917 සිට 1921 දක්වා කාලය තුළ බලාපොරොත්තු වූ තරම් ආර්ථික ප්‍රගතියක් ඇති කොට ගැනීමට ලෙනින්ට නොහැකි විය. එබැවින් 1921-1924 කාලය තුළ ලෙනින් නව ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කෙළේ ය. ඒ අනුව ඉඩම්, මහා පරිමාණ කර්මාන්ත, බැංකු හා වෙළෙඳ කටයුතු ජනතාව සතු විය. භාණ්ඩ බෙදා හැරීම සිල්ලර වෙළෙඳාම වැනි කටයුතුවලට ජනතාවට සහභාගි විය හැකි විය. මේ ආර්ථික ප්‍රතිපත්ති නිසා කාර්යක්ෂම වෙළෙඳපොළක් ඇති වී ආර්ථිකය ශක්තිමත් විය.



රූපය 5.3 වී. අයි. ලෙනින් මහතා

ලෙනින් විසින් ඇති කරන ලද පාලන තන්ත්‍රය නිසා ඒකාබද්ධ හා ශක්තිමත් පාලනයක් බිහි විය. එමෙන් ම ආර්ථිකය ද බලවත් විය. ලෙනින්ට පසු ව බලයට පත් වූ ජෝෂප් ස්ටාලින් දැඩි පාලකයකු ලෙස ප්‍රකට ය. 1924 දී රුසියාවේ ආඥාදායකයා වූ ඔහු පස් අවුරුදු සැලසුම් ක්‍රියාත්මක කෙළේ ය. එහි අරමුණ වූයේ,රුසියාව ආර්ථික අතින් බලවතකු බවට පත් කිරීම යි. පළමු පස් අවුරුදු සැලැස්ම 1928 දී ක්‍රියාත්මක කෙළේ ය. ඒ යටතේ මහා පරිමාණ සමූහ ගොවි පොළවල් ඇති කරනු ලැබිණි. ඒවායෙහි නවීන තාක්ෂණ උපකරණ හා ක්‍රම යොදා ගත් අතර සමූපකාර ක්‍රමය ක්‍රියාත්මක විය. මේ නිසා රැකියා බහුල විය. ආර්ථිකය දියුණු විය. නිෂ්පාදනය පුළුල් විය.



රූපය 5.4 රුසියාවේ මැයි දිනය

ස්ටාර්ලින් පස් අවුරුදු සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා "ගෝස්ප්ලන්" නම් රාජ්‍ය කොමිෂන් සභාවක් පත් කෙළේ ය. එම පස් අවුරුදු සැලැස්ම අනුව රුසියාවේ කාර්මික නිෂ්පාදනය 136%කින් ද කෘෂිකාර්මික නිෂ්පාදනය 35%කින් ද වැඩි කිරීමට බලාපොරොත්තු වූයේ ය. තව ද විදේශීය විශේෂඥයින් ගෙන්වා ගෙන පර්යේෂණ කටයුතු වැඩි කිරීමට ද සැලසුම් කරන ලදී. බලාපොරොත්තු වූ ඛනිජ තෙල් නිෂ්පාදන මට්ටම වසර 2 1/2 ක දී ළඟා කොට ගත හැකි විය. ට්‍රැක්ටර්, ගොවි උපකරණ හා මෝටර් රථ නිෂ්පාදනයේ ප්‍රගතිය ද වසර 3ක දී සාක්ෂාත් කර ගැනීමට හැකි විය. යකඩ , වානේ හා රෙදි පිළි නිෂ්පාදනයේ ප්‍රගතිය ද අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ ගියේ ය. තුර්කිස්ථාන් - සයිබීරියන් දුම්රිය මාර්ගය තැනීම ද අපේක්ෂිත කාලයට වඩා වසරකට පෙර නිම කෙරිණි.

මේ ආකාරයට පළමු පස් අවුරුදු සැලැස්ම සාර්ථක වීම නිසා තව දුරටත් පස් අවුරුදු සැලසුම් ක්‍රියාත්මක කෙරිණි. ඒ තුළින් රුසියාව ආර්ථික වශයෙන් බලවත් විය.

ස්ටාලින්ට පසු බලයට පත් වූ නිකිතා කෘෂේප් ද පස් අවුරුදු සැලසුම් ඉදිරියට ගෙන ගියේ ය. ඔහු නිෂ්පාදන කර්මාන්ත වඩාත් ශක්තිමත් කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් සංවිධාන පිහිටුවා ඒවාට ආර්ථික කටයුතු පවරන ලදී.

ආර්ථික වශයෙන් ශක්තියක් ලැබීම නිසා අධ්‍යාපන හා විද්‍යාත්මක ක්ෂේත්‍රවල ද දියුණුවක් ඇති විය. 1932 දී විදුලි ජනනය සඳහා න්‍යෂ්ටික ශක්තිය යොදා ගැනීමට රුසියාව පර්යේෂණවල නියැලුණි. දෙවන ලෝක යුද්ධයෙන් පසුව, එක්සත් ජනපදය ප්‍රමුඛ ධනවාදී කඳවුර සමඟ ඇති වූ තරගය නිසා, මිසයිල උඩුගුවනේ රැඳවීම කෙරෙහි ද අවධානය යොමු විය. මේ නිසා 1960 වන විට අභ්‍යාවකාශ පිළිබඳ පරීක්ෂණ පුළුල් කෙරිණි. 1961 දී රුසියානු ජාතික යූරි ගගාරින් මුලින් ම අභ්‍යවකාශය තරණය කළ මිනිසා ලෙසත්, ඉන් පසු ව "වෙලන්ටිනා තෙලෙස්කෝවා" මුලින් ම අභ්‍යවකාශය තරණය කළ කාන්තාව ලෙසත් ඉතිහාස ගත වී ඇත.

රුසියාව අත්කොට ගත් දේශපාලන හා ආර්ථික ශක්තිය නිසා සමාජවාදී න්‍යාය ලොව ප්‍රචලිත කිරීමට ඔවුන්ගේ ධනය විශාල වශයෙන් යෙදවිය හැකි විය. රුසියානු රජයේ අනුග්‍රහයෙන්, රුසියානු දේශපාලන ආර්ථික සහ සමාජ ක්‍රම ගැන, විවිධ රටවල විවිධ භාෂාවලින් ග්‍රන්ථ මුද්‍රණය කොට, ඉතා අඩු මිලට බෙදා හරින ලදී.

## රුසියාව සමාජවාදී කඳවුරේ නායකත්වයට පත්වීම

ආර්ථික වශයෙන් ප්‍රබලත්වයට පත් රුසියාව තම සමාජවාදී ක්‍රමය ව්‍යාප්ත කිරීමේ නිරත විය. 1940 දශකයේ අග දී උතුරු කොරියාවේ සමාජවාදී රාජ්‍යයක් බිහි විය. 1949 දී මාවෝ-සේ-තුං යටතේ චීන මහජන සමූහාණ්ඩුව නමින් සමාජවාදී රාජ්‍යයක් බිහිකර ගත හැකි විය. ඉන් පසු ව ද සමාජවාදී චීනයට සෝවියට් ආධාර ලබා දුනි. 1959 දී එක්සත් ජනපද ආධාර ලැබූ ඒකාධිපති පාලකයකු ලෙස කටයුතු කළ, බැටිස්ටාගේ රජය පෙරළා දමා කියුබාවේ සමාජවාදී රජයක් බිහි කිරීමට, පිදෙල් ක්‍රස්තෝට හැකි විය. එ මෙන් ම නැගෙනහිර යුරෝපයේ පෝලන්තය, රුමේනියාව, හංගේරියාව, බල්ගේරියාව, චෙකෝස්ලෝවැකියාව, නැගෙනහිර ජර්මනිය වැනි රටවලට ද සමාජවාදී ක්‍රමය ව්‍යාප්ත විය.

## වෝර්සෝ සංවිධානය පිහිටුවා ගැනීම

නැගෙනහිර යුරෝපයේ සමාජවාදී කඳවුරට පක්ෂ වූ නැගෙනහිර ජර්මනිය, පෝලන්තය, හංගේරියාව, බල්ගේරියාව, චෙකෝස්ලෝවැකියාව, රුමේනියාව, රුසියාව වැනි රටවල් 1955 මැයි 11 වැනි දින පෝලන්තයේ වොර්සෝ නගරයට එක් ව වොර්සෝ සම්මුතිය අත්සන් කළහ. එය හුදෙක් නේටෝ සංවිධානයෙන් එල්ල විය හැකි තර්ජන වලට මුහුණ දීම සඳහා පිහිටුවා ගැනිණි. ''කිසියම් සතුරු රටක් මෙම සංවිධානයට අයත් රටවලට එරෙහි ව යුදමය ක්‍රියා මාර්ගයක් අනුගමනය කළහොත්, එය තම රටට එල්ල වූවක් ලෙස සලකා සාමූහික ව ක්‍රියා කිරීමට" සාමාජික රටවල් ගිවිස ගත්හ.

සමාජවාදී ක්‍රමය ව්‍යාප්ත කිරීම සහ ආරක්ෂා කිරීම මෙම සංවිධානයේ මූලික අරමුණ විය. ඒ අනුව මෙම සංවිධානය 1956 හංගේරියානු විප්ලවයට සහාය වූ අතර 1968 දී චෙකෝස්ලෝවැකියානු අරගලයට ද සහාය විය. එම අවස්ථාවල දී ඇත්ත වශයෙන් ම සිදු වූයේ සෝවියට් රුසියාව වෝර්සෝ සංවිධානය හරහා එම රටවලට ආධාර සැපයීම ය.

## සමාජවාදී අදහස් ව්‍යාප්ත වීම

චීන හා කියුබානු විප්ලවයෙන් පසු ව ආසියා-අප්‍රිකා රටවල ද කොමියුනිස්ට් පාලන රැල්ලක් හමා ගියේ ය. හෝ-චි-මින්ගේ ප්‍රධානත්වයෙන් වියට්නාමය තුළ කොමියුනිස්ට් ආණ්ඩුවක් බිහි විය. බෙල්ජියම් කොංගෝවේ නායක පැට්‍රිස් ලුමුම්බා සමාජවාදී ක්‍රමයට නැඹුරු විය. එහෙත් ධනවාදී පිළේ මෙහෙයවීම යටතේ මොයිස් ෂොම්බේ, ඔහු මරා දමා කොංගෝවේ බලය අල්ලා ගත් බව ඉහත දුටිමු. ඊජිප්තුවේ

අබ්දුල් ගමාල් නසාර් අස්වාන් වේල්ල තැනීමට බටහිර ආධාර ඉල්ලා ලබා නොදුන් නිසා සමාජවාදී කඳවුරට නැඹුරු විය. එමෙන් ම ලිබියාවේ ගඩාපි, ඉන්දියාවේ ගාන්ධිවරු, රුසියාවේ සමාජවාදී ක්‍රමයට සෘජුවම නැඹුරු නොවුවත් ඇමරිකානු ධනවාදය ද අනුමත නො කළහ. ඇෆ්ගනිස්ථානයේ ද රුසියානු හමුදා රඳවන ලදී. 1948 නිදහස ලබා ගැනීමෙන් පසුව අගමැති තනතුර දරූ එක්සත් ජාතික පක්ෂයේ නායක ඩී. එස්. සේනානායක මහතා ධනවාදී පිලට නැඹුරු වී එම රටවල් සමඟ පමණක් සම්බන්ධතා ඇති කර ගත්තේ ය. එහෙත් 1956 දී අගමැති තනතුරට පත් වූ එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා සමාජවාදී පිල සමඟ ද විදේශ සම්බන්ධතා ඇති කොට ගනිමින් ආර්ථික ආධාර ලබා දෙන ගිවිසුම් කිහිපයකට එළඹිණි.

## (ජාතික ආරක්ෂක කමිටුව) K. G. B. ඔත්තු සේවය

සමාජවාදී පිලේ ඔත්තු සේවය වූ ජාතික ආරක්ෂක කමිටු (K. G. B.) සංවිධානය ඇමරිකානු CIA සංවිධානය මෙන් ම ප්‍රබල සංවිධානයකි. රුසියාවේ මොස්කව් මූලස්ථානය කොටගෙන ලොව පුරා ක්‍රියාත්මක වූ මෙම ඔත්තු සේවය ප්‍රතිපාක්ෂික එක්සත් ජනපදය ප්‍රමුඛ ධනවාදී රටවල යුද රහස් ලබා ගැනීමට හා සමාජවාදී ක්‍රමය ප්‍රචලිත කිරීමට යොදා ගන්නා ලදී. ඇතැම් විට මධ්‍යම රහස් ඔත්තු සංවිධානයේ (CIA) නිලධාරීන්ට ද මුදල් ගෙවා තොරතුරු ලබාගෙන ඇත. විදේශවල තානාපතිවරු, මහාචාර්යවරුන්, රාජ්‍ය නිලධාරීන් ඇතුළු විවිධ පුද්ගලයෝ මෙම සංවිධානයට සම්බන්ධ වූහ. නවීන තාක්ෂණය ද ඊට යොදාගෙන තිබේ. මෙම සේවාවෙහි අරමුණ ධනවාදී කඳවුරේ රහස් ලබාගෙන ඒවාට ප්‍රතිවාදී ලෙස සමාජවාදී ක්‍රමය ව්‍යාප්ත කොට හැරීම ය.

මේ අනුව බලන විට ඇමරිකා එක්සත් ජනපදය, ධනවාදී ක්‍රමය ආරක්ෂා කිරීමට හා ව්‍යාප්ත කිරීමට කටයුතු කෙළේ යම් සේ ද, සෝවියට් රුසියාව සමාජවාදී ආර්ථිකයත් කොමියුනිස්ට් පාලන තන්ත්‍රයත් ව්‍යාප්ත කිරීමට හා ආරක්ෂා කිරීමට එලෙසින් ම උත්සාහ දරා ඇත.

**ශිෂ්‍ය ක්‍රියාකාරකම**

ලෝක සිතියමක නේටෝ සංවිධානයේ රටවල් හා වෝර්සෝ සංවිධානයට අයත් වූ රටවල් එකිනෙකට වෙනස් පාටවලින් ලකුණු කොට නම් කරන්න.